# ඌව පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ යන්ත්‍ර ක්‍රියාකරු සහයක හා ග්‍රීසර් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම- 2026

01. ඌව පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඌව පළාත් රාජ්‍ය සේවයේ යන්ත්‍ර ක්‍රියාකරු සහයක තනතුරු 06 ක් හා ග්‍රීසර් තනතුරු 01ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් 2026 සැප්තැම්බර් 23 දින දක්වා අයදුම්පත් කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම තනතුරු වලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

අ. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ආ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු දහඅට (18) ට නොඅඩු අවුරුදු හතලිස් පහ (45) ට නොවැඩි විය යුතුය.

ඇ. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

ඇ. සෑම අපේක්ෂකයකුම ඌව පාළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඉ. අයදුම්පත් කැඳවන අවසාන දිනට ඌව පළාතේ අවම වශයෙන් පූර්ව ආසන්න වසර 5 ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් වියයුතු අතර, ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන නියමිත ආකෘතිය මඟින් පදිංචිය සනාථ කළ යුතුය.

ඊ. පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙන් විෂයන් 02 ක් වත් සමත් වී තිබිය යුතුය.

උ. වෘත්තීය යෝග්‍යතා

- රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක බර වාහන සහයක, ග්‍රීසර්, කාර්මික සහයක තනතුරක සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**සැලකිය යුතුයි - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026 සැප්තැම්බර් 23 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

03.අයදුම්පත් ඉදිරිපත් කිරීම

I. සම්පූර්ණ කරන ලද අයදුම්පත 2026 සැප්තැම්බර් 23 දින හෝ ඊට පෙර **" නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, පිං අරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙරවරේ **"පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සඳහා ඉල්ලීම්"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

II. අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසන් දිනය දක්වා ප්‍රමාද කිරිමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරුවන් විසින් විදදරා ගත යුතුය.

04. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙක් / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු/ සාමදාන විනිශ්වකාරවරයෙකු /දිවිරුම් කොාමසාරිස්වරයෙකු/ ප්‍රසිද්ධ කොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ ගැසට් කර තනතුරක් දරන නිලධාරිවරයෙකු/ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන ස්ථිර මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

05. පරිපාලන වියදම් රු.1250.00 කි. මෙම මුදල ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ලන්නා ලද ලදුපතේ මුල් පිටපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පතට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇනවුම්පත් මුද්දර හෝ භාරගනු නොලබන අතර එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලැබේ. ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

06.

අ. පත්කරන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්වය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

ආ. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ ප්‍රථමික - ශිල්පීය නොවන ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ පනවා ඇති නියම හා කොන්දේසි වලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධන වලටද ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසි විධි විධාන වලටද ඌව පළාත් සභා කාර්ය පටිපාටික රීති වලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් පත් කර ගනු ලැබේ.

07. වැටුප / දීමනා

- මෙම තනතුරට වැටුප් හා දීමනා ලෙස 2026 වර්ෂයේ මාසිකව රු. 56,663.00 ක් ගෙවනු ලැබේ ( රු. 38863.00 + ජීවන වියදම් දීමනාව රු. 17800.00).

08. මෙය හුදෙක්ම කොන්ත්‍රාත් පදනමින් කරනු ලබන පත්කිරීමක් වන අතර ස්ථිර තත්වය ඉල්ලා සිටිමට මෙමඟින් කිසිම අයිතිවාසිකමක් නොමැත.

09. සම්මුඛ පරීක්ෂණය
ඉහත සඳහන් ආකාරයට නිවැරදි අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට සුදුසුකම් ලබයි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පත්වීම් බලධරයා විසින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා අදාල පත්වීම් බලධරයා වේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඩුවම්

1. අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මෙම බඳවා ගැනීමට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටිමට නුසුදුසු වෙතයි පෙනී යන ලද නම් සම්මුඛ හා ව්‍යුහගත පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ හා ව්‍යුහගත පරීක්ෂණය පැවැත්වෙන අතර හෝ ඊට පසුව හෝ කවර අවස්ථාවකදී වුවද ඔහුගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

2. අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසුකලකදී වැරදි බව පෙනී ගියහොත් ඔහු විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළි වුවහොත් හෝ ඔහු තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොබලනු අතර, මෙම විභාගය හේතුකොට ගෙන දී තිබූ පත් වීමක් හෝ අහෝසි කිරිමට යටත්වේ.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

13. මේ පිළිබඳව වැඩි විස්තර කාර්යාල වේලාව තුළ ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ දුරකතන අංක 055-2222217 හෝ ඌව පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 057-2233017 ඇමතීමෙන් ලබා ගත හැකිය.

ඉංජි. පී.එම්. අමරසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)

2026.08.19 වන දින
බදුල්ල
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේදීය